**ශීර්ෂය 283 - වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගණනය කල මතය**

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන් , වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවීම.**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව වූ සැසඳුම් ප්‍රකාශය**<br>2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විෂය අංක 283011 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳව සැසඳුම් ප්‍රකාශය 2020 පෙබරවාරි 28 දිනට හෝ ඊට පෙර විගණනයට ඉදිරිපත් කල යුතු වුවත්, එය මාස 04 ක් ප්‍රමාදයකින් පසුව 2020 ජූලි 03 දින ඉදිරිපත් කර තිබුණි. | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **ස්ථාවර වත්කම් ලේඛනය**<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වා ගත යුතුය. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 267/2018 මඟින් ලබා දී ඇති පොදු උපදෙස් අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන යාම අනිවාර්ය නොවන බව දන්වා ඇති බව. |

(ආ) **බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් තරම් අක්මුදල් තිබෙන නිසා බැරකම් ලේඛනයක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව. |

**1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | ප්‍රාරම්භක වාර්තා හා පරිපූර්ණ වාර්තා ඉදිරිපත් නොකරන ලද හානිවීම් 09 ක් සමාලෝචිත වර්ෂයේදී වාර්තා කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පරිපූර්ණ වාර්තාවක් හා අවසාන වාර්තාවක් ඉදිරිපත් කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) මුදල් රෙගුලාසි 396(ඇ) | නිකුත් කරන ලද නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවන ලද වටිනාකම රු. 175,323 ක් වූ චෙක්පත් 7 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | අදාල චෙක්පත් සම්බන්ධයෙන් මේ වන විට මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර ඇත. |
| (ඇ) මුදල් රෙගුලාසි 507 හා මුදල් රෙගුලාසි 756 | මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර සමීක්ෂණ මණ්ඩල පත්කර මු.රෙ 128 යටතේ අදාල කාලරාමුව තුල භාණ්ඩ සමීක්ෂණ සිදු කල යුතු වුවද 2020 මැයි 31 දින වන තුරුත් 2019 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | මු.රෙ 128 යටතේ අදාල කාලරාමුව තුල භාණ්ඩ සමීක්ෂණ සිදු කල යුතුය. | කෝවිඩ් 19 හේතුවෙන් සියලුම දිසා වන කාර්.යාල, නුවරඑළිය කලාපය සහ නුවරඑළිය වන විද්‍යායතනය යන ස්ථානයන්හි භාණ්ඩ සමීක්ෂණ සිදු කර නොමැති අතර ඒ සම්බන්ධව කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ඇ) මුදල් රෙගුලාසි 570 හා 571(2) | ඇප තැන්පතු හා තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රදවා ගන්නා තැන්පතු සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේදී නොපියවූ අග්‍රිම ශේෂය රු.3.067,449 ක් විය. නොපියවූ ශේෂයෙන් රු. 2,817,188 ක් 2020 මැයි 29 දින පියවා ඇති අතර තවදුරටත් නොපියවූ ශේෂය රු.250,261 කි. | මු.රෙ 373(1) ප්‍රකාරව හා 2019 නොවැම්බර් 11 දිනැති අංක 05/2019 භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ ප්‍රකාරව 2020 ජනවාරි 06 දිනට මුදල් පොතේ ශේෂය පියවිය යුතුය. | 2019 වසරේදී මැතිවරණ කටයුතු වල නියුතු වූ නිලධාරීන්ට ගෙවූ දීමනා අත්තිකාරම් පියවීම සඳහා මැතිවරණ කාර්යාලයෙන් චෙක්පත් 2019 වසර තුල නොලැබීම නිසා රු.3.067,449 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |

### 2.2 ආදායම් කළමනාකරණය

--------------------------

ආදායම් ඇස්තමේන්තු පිලියෙල කිරිම, හිඟහිටි ආදායම් රැස්කිරීම, ආදායම් අත්හැරීම හා කපා හැරීම සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වාර්.ෂික සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව පුද්ගලික දැව ප්‍රවාහනය ආදායම් සංකේතයට ආදාළව රු. මිලියන 125 ක බලපත්‍ර ගාස්තු ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී | මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් නිවැරදි ආදායම් ඇස්තමේන්තු පිලියෙල කිරිම හා අදාල වන පරිදි සංශෝධනයන් කළ යුතු | ආදායම තීරණය කිරීම සියයට සියයක් නිවැරදිව පුරෝකථනය කිරිම අපහසුය. |

| | | | |
|---|---|---|---|
| | රු. මිලියන 108.93 ක ශුද්ධ ආදායමක් රැස් කර තිබුණි. එබැවින් ආදායම් සීමාවට ලඟා නොවීම රු. මිලියන 16.07 ක් වූ අතර එය සියයට 12.85 කින් පහළ යාමක් විය. | අතර, 2015 ජුලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුගමනය කර ආදායම් පරිපාලනය වඩාත් කාර්යක්ෂමව ඉටු කළ යුතුය. | |
| (ආ) | රජයේ කැළෑවලින් ලැබෙන ආදායම් සංකේතයට ආදාළව රු.මිලියන 2,620 ක වාර්ෂික ආදායමක් රැස් කිරිමට ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයෙදි රු. මිලියන 1,846.74 ක ශුද්ධ ආදායමක් රැස් කර තිබුණි. එබැවින් ආදායම් සීමාවට ලඟා නොවීම රු.මිලියන 773.20 ක් වූ අතර එය සියයට 29.51 කින් පහළ යාමක් විය. | -එම- | ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 1,800 සිට රු.2,620 දක්වා ඉහල දමා ඇත. |
| (ඇ) | පසුගිය වර්ෂ 03 තුල ඉහත ආදායම් සංකේත 02 කට අදාල මුළු හිඟ ආදායම පිළිවෙලින් රු. මිලියන 1.21 ක් හා රු. මිලියන 52.53 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේ තවදුරටත් හිඟ මුදල පිළිවෙලින් රු. මිලියන 0.98 ක් හා රු. මිලියන 52.87 ක් විය. | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව ආදායම් එකතු කරන නිලධාරියා කටයුතු කළ යුතුය. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරිම පැහැර හැර ඇති නිලධාරින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අදහස් දක්වා නොමැත. |

## 2.3 වියදම් කළමනාකරණය

වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ප්‍රතිපාදන මාරු කිරීම, පරිපූරක අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබා ගැනීම හා උපයෝජනය, ප්‍රතිපාදන උපයෝජනය කිරීම, ඉතිරිවීම් සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට 10 සිට සියයට 51 දක්වා පරාසයක විචලතාවයක් නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | වැය විෂය අංක 2105 ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා මු.රෙ 66 මඟින් රු.60,000,000 ක ප්‍රතිපාදන මාරුකර ගෙන තිබුණද එම වැය විෂය යටතේ ඉතිරිවීම් ලෙස වර්.ෂය අවසානයේ රු. 68,363,232 ක් විය. ප්‍රතිපාදන මාරුකිරීමට පෙර මුළු ප්‍රතිපාදනවලින් සියයට 8.55ක ඉතිරියක් වූ අතර මු.රෙ. 66 මඟින් මාරු කරන ලද ප්‍රතිපාදන සියයට සියයකම ඉතිරිවීමක් නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ප්‍රමාණවත් ප්‍රතිපාදන පමණක් මාරු කල යුතුය. | අයවැය දෙපාර්තමේන්තු ලිපි අංක BD/EE/160/09/Gen-2017 ලිපියට අනුව ප්‍රතිපාදන කප්පාදු කිරීම මෙම ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු විය. |
| (ඇ) | කළමනාකරණය විසින් නිසි පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ආහාර පාන හා නිල ඇඳුම් වැය විෂයය (1203) යටතේ වෙන් කරන ලද රු.15,000,000 ක් වූ ප්‍රතිපාදන මුදලින් සියයට 51 ක් හෙවත් රු. 7,693,558 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඈ) | වැය විෂය අංක 2507 පර්යේෂණ හා සංවර්ධන යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදනවලට අමතරව මු.රෙ. 66 මඟින් රු.3,000,000 ක මුදලක් මාරු කර තිබුණද වර්ෂ අවසානයේ එම මුදල ඉක්මවා එනම් රු.5,055,355 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබූ බව නිරීක්ෂණය විය . | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2019 අප්‍රේල් 08 දිනැති අංක 3/2019 හා 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අය වැය චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදනවලින් සියයට 25 ක ප්‍රතිපාදනයක් අනිවාර්.යයෙන් ඉතිරි කළ යුතු වුවද අංක 2002, 2102, 2104, 2106, 2003, 2103, 2105 සහ 2401 දරන වැය විෂයයන්ට අදාලව එලෙස කටයුතු කර නොතිබුණි. | 2019 අප්‍රේල් 08 දිනැති අංක 3/2019 හා 2019 සැප්තැම්බර් 24 දිනැති අංක 5/2019 දරන ජාතික අය වැය චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදනවලින් සියයට 25 ක ප්‍රතිපාදනයක් අනිවාර්.යයෙන් ඉතිරි කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |

**2.4** **තැන්පතු ශේෂයන්**

**-------------------**

පහත සඳහන් නිරික්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------- | ----------- | ------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඇප තැන්පතු ශේෂය රු. මිලියන 402.16 ක් විය. ඒ අතරින් රු. මිලියන 110.43 ක් වූ තැන්පතු වර්ෂ 05 ක් ඉක්මවූ තිබූ අතර රු. මිලියන 199.95 ක් තැන්පතු වර්ෂ 02 ක් ඉක්මවා පැවති තැන්පතු බව නිරීක්ෂණය විය. | මු.රෙ. 571(2) ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු අදාල තැන්පතු කරුවන්ගෙන් විමසීමක් කර සුදුසු පරිදි කටයුතු කිරීම | වර්ෂ 02 කට වැඩි වුවද සම්පූර්ණ නොකල ව්‍යාපෘති වෙනුවෙන් එම ශේෂ තැන්පතු ගිණුමේ පවත්වා ගෙන යන බව. |
| (ආ) | තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ශේෂය රු. මිලියන 53.5 ක් වූ අතර ඒ අතරින් රු. මිලියන 3.97 ක් වූ තැන්පතු වර්ෂ 05 ක් හා රු. මිලියන 6.31 ක් වූ තැන්පතු වර්ෂ 02 ක් ඉක්මවා තිබුණි. | - එම - | වර්ෂ 02 කට වැඩි වුවද සම්පූර්ණ නොකල ව්‍යාපෘති වෙනුවෙන් එම ශේෂ තැන්පතු ගිණුමේ පවත්වා ගෙන යන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තෙවන පාර්ශවයක් වෙත නැවත ගෙවීම සඳහා තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු ලැබීම් රු. මිලියන 391.35 ක් වු අතර එය මුළු තැන්පතු වලින් සියයට 73.66 ක් විය. | තෙවන පාර්ශවය දැනුවත් කර අදාළ කාර්යයන් අවසන් වී ඇත්නම් තැන්පතු ආපසු ගෙවීමට කටයුතු කල යුතුය. | ඇප මුදල් ඉදිරියේදී රාජ්‍ය ආදායමට බැර කරන බව. |
| (ඈ) | පොළොන්නරුව දිසාව විසින් රු. මිලියන 3.84 ක් වු මුළු ආරක්ෂිත තැන්පතු වලින් රු. මිලියන 1.68 ක් වු තැන්පතු රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි. | මු.රෙ. 571 ප්‍රකාරව වර්ෂ දෙකක් ඉක්මවූ ආරක්ෂිත තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අලාභය රු. 25,000 ට අඩු සිද්ධීන් 25 කට අදාලව රු. 222,414 ක් ද, අලාභය රු. 25,000 ට වැඩි සිද්ධීන් 60 කට අදාලව රු. 21,460,949 ක්ද 2019 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණු අතර, ඉන් රු. 6,156,071 වු සිද්ධීන් 36 ක් සඳහා අලාභ සිදුවී වර්ෂ 10 ටත් වැඩි කාලයක් ගතවී තිබුණි. | වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීම හා අවශ්‍ය විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම හෝ කපා හැරීමට ක්‍රියා කළ යුතුය. | අදහස් දක්වා නැත. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනයෙහි සටහන (i) පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුලත් කර තිබු සමාලෝචිත වර්ෂයේ හානිවීම් 10 ක් හා සටහන (i) යටතේ ඇතුලත් කර නොතිබු හානිවීම් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව කිසිදු අවසාන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභ හානි ලෙස හඳුනා ගත හැකි හානි සඳහා අවසාන වාර්.තා ඉදිරිපත් කළ යුතුය. | අදහස් දක්වා නැත. |

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

| විගණන විමසුම පිළිබඳ විස්තරය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 02 කට අදාලව 2020 ජුනි 30 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණන විමසුම් වලට කඩිනමින් පිළිතුරු ලබා දිය යුතුය. | අදහස් දක්වා නැත. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | පුත්තලම දිසාවේ වීරක්කුලිචෝලේ රක්ෂිතයේ අනවසර දැව හෙලීම් සම්බන්ධව 2018 වර්ෂයේ ජූලි සිට මේ දක්වා මූලික විමර්ෂණ කණ්ඩායම් 04 ක් පත් කර තිබුණු අතර කිසිදු කණ්ඩායමක් 2020 ජුනි 30 දින වන විටත් ඒ සම්බන්ධයෙන් වූ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | මූලික විමර්ෂණයක් සිදු කර වාර්තාවක් කඩිනමින් ඉදිරිපත් කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ආ) | වීරක්කුලිචෝලේ මූලික විමර්ෂණ කමිටු වාර්තාව ඉදිරිපත් නොකිරිම තුල රක්ෂිතයෙන් අනවසරයෙන් හෙලීම් කර ඇති පලු, පානක්කා, වීර ආදි ගස් 1,443 ක් සම්බන්ධයෙන් 2020 ජුනි වන විටත් කිසිදු තොරතුරක් නොමැති අතර වන අපරාධය සම්බන්ධයෙන්ද නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | මූලික විමර්.ෂණ කමිටු වාර්.තාව කඩිනමින් ඉදිරිපත් කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්.ග ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඇ) | රක්ෂිතයෙන් දැව හෙලීම් කර ඇති ගස් 139 ක දැව පරිමාව ඝෙසි මීටර් 263,977 ක වටිනාකම රු. මිලියන 6.93 ක් ලෙස හදුනා ගෙන තිබුණද අනෙකුත් ගස් 1,304 දැව පරිමාව හා මූල්‍යමය වටිනාකම ගණනය කර නොතිබුණි. | දැව පරිමාව හා මූල්‍යමය වටිනාකම ගණනය කර එමගින් රජයට සිදු වී ඇති අලාභය අනාවරණය කර ගත යුතුය. | අදහස් දක්වා නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පුත්තලම දිසාවේ විවිධ අවසරපත්‍ර අංක H7/911/2016 යටතේ බලපත්‍රකරුවකු කළුගල් ඇඹරුම් යන්ත්‍රයක් සඳහා අවසර ලබා ගෙන තිබුනද අනුමත භූමි ප්‍රමාණය ඉක්මවා පර්චස් 525 ක් පමණ 2013 වර්ෂයේ සිට භාවිතා කර තිබුණි. | බලපත්‍රකරු අනවසරයෙන් භාවිතා කර ඇති භූමි ප්‍රමාණය සඳහා හිග බලපත්‍ර ගාස්තු අයකල යුතුය. | වැඩිපුර භාවිතා කර ඇති භූමි ප්‍රමාණය සඳහා නියමිත ගාස්තු අය කිරීමට කටයුතු කරන බව. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අම්පාර හා වව්නියාව දිසා වන කාර්යාලවල කළුගල් වැඩපලවල් පවත්වා ගෙන යන බලපත්‍රකරුවන් විසින් අනුමත බලපත්‍ර සීමාවන් ඉක්මවා වැඩිපුර කළුගල් කැඩීම සිදු කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම කළුගල් වැඩපලවල් විධිමත් අධීක්ෂණයක් සිදු කර නොතිබු අතර එමඟින් රජයට අයවිය යුතු හිග ගාස්තු අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | බලපත්‍රකරුවන් වැඩිපුර කඩා ඉවත් කර ඇති කළුගල් කියුබ් ප්‍රමාණය නිශ්චය කර ගැනීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වාර්තාව මත හිඟ ගාස්තු අය කර ගත යුතුය. | අම්පාර දිසා වන කාර්යාලයට අදාලව වැඩිපුර කඩන ලද කළු ගල් ප්‍රමාණ සඳහා හිග මුදල් ගෙවන ලෙස බලපත්‍රකරුවන්ට ලිපි මඟින් දැනුම් දී ඇත. අතර වව්නියාව දිසා වන කාර්යාලයේ විගණන විමසුමට මෙතෙක් අදහස් දක්වා නොමැත. |
| (ඊ) | 2018 වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේදී අම්පාර දිසා වන කාර්යාලයට අයත් අඩවි වන කාර්යාලවලින් දැව ව්‍යාපාර ලියාපදිංචි කිරීම් හිග බලපත්‍ර ගාස්තු රු.366,375 ක් අය කර ගෙන නොතිබුණි. | බලපත්‍රකරුවන්ගෙන් හිඟ ගාස්තු අය කිරීමට කළමනාකරණය අවධානය යොමු කල යුතුය. | ලියාපදිංචිය රහිතව ක්‍රියාත්මක කරන දැව ව්‍යාපාර සම්බන්ධව නීතිමය ක්‍රියා මාර්ග ගනු ලබන බව. |
| (උ) | කෑගල්ල දිසාවේ තරණගල මූකලාන රක්ෂිතයෙහි කසල අපහරණය හා ප්‍රතිචක්‍රීකරණය ව්‍යාපෘතියෙහි මුළු භූමි ප්‍රමාණය හෙක්. 1.234 කි (පර්චස් 488). තක්සේරු දෙපාර්තමේන්තුවට අනුව ව්‍යාපෘති භූමියෙහි පර්චසයක තක්සේරු වටිනාකම රු. 564 ක අවම අගයක් වී තිබුණි. | නව තක්සේරු වාර්තාවක් මත පදනම්ව වාර්ෂික බදු කුලී අය කල යුතුය. | සබරගමුව පලාත් තක්සේරු කරු විසින් 2010 නොවැම්බර් 08 දිනැති ලිපිය මගින් හෙක්. 1.234 ක (පර්චස් 488) වර්තමාන වෙළඳපල වටිනාකම රු.275,000 ක් ලෙස තක්සේරු කර ඇත. |
| (ඌ) | ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමේදී රක්ෂිතයෙහි පැවති ෆයිනස් ඇතුළු වෙනත් ගස් 725 ක් පමණ පූර්ණ හෙලීම් කර තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සොබාදහමට සිදු වන හානිය හැකිතරම් අවම විය යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (එ) | කෑගල්ල දිසා වන කාර්යාලයේ ගිණුම් අංශය විසින් පවත්වා ගෙන යන නව සිගාස් පද්ධතියෙහි දෝෂයන් පවතින බව නිරීක්ෂණය විය. | දෝෂයන් නොමැතිව පද්ධතිය විධිමත්ව පවත්වා ගෙන යා යුතුය. | සිගාස් පද්ධතියෙහි පවතින දෝෂයන් සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත දැන්වීමට කටයුතු කරන බව. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කෑගල්ල දිසා වන කාර්.යාලයේ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමේදී වාහන අමතර කොටස් හා වෙනත් මිලදී ගැනීම් සිදු කිරීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් මිලදී ගැනීම් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කල යුතුය. | මින් ඉදිරියට ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් එම සේවාව ලබා ගැනීමට කටයුතු කරන බව |
| (ඔ) | හුරුළු ජාතික උද්‍යානයේ දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා නව තාක්ෂණය භාවිතා කරමින් ප්‍රවේශ පත්‍ර නිකුත් කල හැකි ක්‍රමවේදයක් නොතිබුණු අතර ඉහත උද්‍යානයේ වැසිකිලි පද්ධතියෙහි පහසුකම් ද ඉතා අවම මට්ටමක පැවතුණි. | ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට නව තාක්ෂණය යොදා ගැනීම සහ වැසිකිලි පද්ධතිය වැඩිදියුණු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ඕ) | හුරුළු උයන ජාතික උද්‍යානයේ දේශීය හා විදේශීය සංචාරකයන් ගෙන් අය කරන ප්‍රවේශ පත්‍ර මිල ගණන් අඩු කිරීම නිසා 2019 දෙසැම්බර් 16 දින සිට 2020 ජනවාරි 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව දෙපාර්තමේන්තුවට අහිමි වූ ආදායම රු.මිලියන 13.07 කි. | බාහිර ස්වේච්ඡා සංවිධානය සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්.ග ගනු ලැබිය යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ක) | අනුරාධපුර දිසා වන කාර්යාලය විසින් 2006 ජනවාරි 25 දින සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා එනම් වර්ෂ 13 ක කාලයක් බොරළු කැණීම් සඳහා ඉඩම් ලබා දී ඇති අතර ඉන් දළ වශයෙන් බොරළු කියුබ් 138,608 ක ප්‍රමාණයක් කැණීම් කර ඇත. මෙම භූමි ප්‍රමාණයේ වර්ෂ 13 ක් මුළුල්ලේම වන රෝපණයක් හා පරිසරය පුනස්ථාපනයක් සිදුව නොතිබුණි. | අදාල භූමි ප්‍රමාණයේ වන රෝපණය හා පරිසරය පුනස්ථාපනය සිදු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 590 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි. | අත්‍යාවශ්‍ය වන පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කල යුතුය. | අදහස් දක්වා නොමැත. |